ගොවි කටයුතු අධ්‍යයනය 1 (1) 1984, 9-14

ප්‍රජා සංවර්ධන න්‍යාය සහ භාවිතය: ශ්‍රී ලංකාවේ නිවාස ව්‍යාපාරය ඇසුරින්

ගාමිණී වික්‍රමසිංහ
විසිනි.

I

හැඳින්වීම

නිවාසයක් යනු මිනිසාගේ මූලික අවශ්‍යතාවයන්ගෙන් එකකි: බැලූ බැල්මට පෞද්ගලිකත්වය හා සම්බන්ධ වූවක් ලෙස නිවාසය පෙනී ගියද සත්‍ය තත්වය නම් එහි ඇති සමාජමය ස්වරූපයයි. පෞද්ගලික මෙන්ම සමස්ත සමාජයේද දියුණුව, 'තරහය' නම් මූල ධර්මය මත පදනම් වී සංවිධානය වී ඇති දියුණු යයි පිළිගන්නා රටවල පවා ජනාවාසකරනයේදී මිනිසුන් කුඩා ප්‍රජාවන් වශයෙන් ඒකරාශිකිරීම කෙරෙහි දැන් විශේෂ අවධානයක් දක්වනු ලැබේ. කොන්ක්‍රීට් ව්‍යුහයන් ශක්තිය අතින් උසස් තත්වයක පැවතුනද ඒවායේ කල් පැවැත්ම සහ මනා නඩත්තුව රඳා පවත්නේ සමාජීය වශයෙන් මිනිසුන්ට ඒවා තුළ නිදහසේ ජීවත් වීමට ඇති හැකියාව මතයි. පෞද්ගලික වශයෙන් ඉහළ තත්වයක් කෙරේ කිසියම් දෙනු ලැබූ සමාජ ආකෘතියක් තුළ ක්‍රියාත්මක වන මිනිසා සමාජය කෙරේ අදළ පරිදි ළං වීමටද නැමියාවක් දක්වයි. වත්මන් මානව ජනාවාස පිළිබඳ සංකල්පය බිහි වී ඇත්තේ මෙම සන්දර්භය තුළිනි. තුන්වන ලෝකයේ රටක් වශයෙන් නිවාස ප්‍රශ්නයට උග්‍ර ලෙස මුහුණ පා සිටින ශ්‍රී ලංකාවේ රාජ්‍යාධාර සහ ස්වේච්ඡා සංවිධාන වල අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වන නිවාස වැඩ පිළිවෙල මගින් මානව ජනාවාස පිළිබඳ සංකල්පය කොතරම් දුරට අර්ථාන්විත කරයිද යන්න නිර්ණය වන්නේද එම වැඩ පිළිවෙල තුලින් ඇති කල හැකි ප්‍රජා සංවර්ධනයේ ස්වරූපය අනුවයි. ප්‍රජා සංවර්ධනය යනු කුමක්ද, නිවාස වැඩ පිළිවෙල තුලින් කුමන ආකාරයේ ප්‍රජා සංවර්ධනයක් ඇති කළහැකිද, මෙහිදී ඇති විය හැකි ගැටළු මොනවාද ප්‍රායෝගික වශයෙන් ඊට යොදු ගත හැකි විසඳුම් මොනවාද යන අංශ සම්බන්ධ විග්‍රහයක් මෙම ලිපියෙන් ඉදිරිපත් කෙරේ.

II

ප්‍රජාව සහ ප්‍රජා සංවර්ධන ක්‍රියාවලිය

ප්‍රජාවක් යනු කිසියම් ප්‍රදේශයක වාසය කරන ජන කොට්ඨාශයකි. එවැනි ප්‍රජාවක ජීවන තත්වය උසස් කර ලීමට ගන්නා ක්‍රියා මාර්ගය ප්‍රජා සංවර්ධනය යනුවෙන් හැඳින්විය හැකිය. මිනිසුන්ට ඔවුන්ගේ අවශ්‍යතා වලින් සමහරක් හඳුනා ගැනීමට හා ඒ සම්බන්ධව කාර්යක්ෂම ව කටයුතු කිරීමට උපකාර වන, අධ්‍යාපනය දෙන, ධෛර්යමත් කරන සියලු සංවිධානාත්මක උත්සාහයන් ප්‍රජා සංවර්ධනයට අයත් වේ. මේ අනුව ප්‍රජා සංවර්ධනය යනු සංකීර්ණ ක්‍රියාවලියක් බවත් ඉහත සඳහන් එක අංශයක් පමණක් දියුණු කරලීමෙන් ප්‍රජා සංවර්ධනයක් ඇති නොවන බවත්, සංවර්ධනය සියළුම අංශ වලින් සිදුවිය යුතු නිසා ඒ සම්බන්ධව විවිධ ආයතන බිහිවී තිබෙන බවත් පැහැදිලි වේ.

මෑතදී නිකුත් වූ 'ප්‍රජා සංවර්ධන වාර්තා' ප්‍රජා සංවර්ධනය නිර්වචනය කොට ඇත්තේ මෙසේය. "කුඩා ප්‍රජාවක් පළමුව ඔවුන්ගේ උවමනාවන් බලවත් ලෙස සාකච්ඡා කොට නිර්වචනය

කොට ඉක්බිති සැලසුමක් අනුව යථෝක්ත උවමනාවන් සංතර්පනය කර ගැනීමට එකට එක්වී ක්‍රියා කිරීම ප්‍රජා සංවර්ධනය වේ.'' මෙහිදී අවධාරණය කොට ඇත්තේ සංවර්ධනයේ මූලාරම්භය ප්‍රජාව තුලින්ම ඇතිවිය යුතු බවයි. මෙය එක් මතයකි. තවත් මතයක් නම් ඒ ඒ ප්‍රජාවන් තුල සිටින විවිධ ආයතන සමිති සමාගම් සහ ඒවායේ කාර්ය කොටස් අනුවද ප්‍රජා සංවර්ධනය ඇතිවිය හැකිය. 1948 එංගලන්තයේ කේම්බ්‍රිජ් හි පැවැති ''යටත් විජිත පරිපාලන'' සාකච්ඡාවකදී ප්‍රජා සංවර්ධනය නිර්වචනය වූයේ මෙසේය. ''කාර්යක්ෂම සහභාගිත්වයෙන් නැත්නම් ප්‍රජාව තුලින්ම මුල පිරීම ඇති කිරීමෙන් සමස්ථ ප්‍රජාවම වඩා හොඳ ජීවන තත්වයකට උසස් කරලීමෙහි ඇති වන ව්‍යාපාරයෙකි.'' නමුත් මේ අනුව ප්‍රජාව තුලින් මුල පිරීම ඇති නොවේ නම් එම ප්‍රජා සංවර්ධන ව්‍යාපාරය ක්‍රමවත් නොවේ. ප්‍රජාවේ මුල පිරීම නිල නොවන අංශ මගින් ශිල්පීය ක්‍රම භාවිතය මගින් උත්තේජනය කළයුතු වේ.

මේ අනුව ප්‍රජාව කෙරෙහිත්, ආයතන කෙරෙහිත් අවධානය යොමු කරමින් නිර්වචනයන්හි යෙදෙන කොටස් දෙකක් තිබෙන බව පෙනී යන අතර ප්‍රජාව කෙරේ අවධානය දක්වන කොටස් ප්‍රජා සංවර්ධනයේ ඵලයට වඩා ක්‍රියාවලිය කෙරේ සැලකිල්ල දක්වන බව පෙනේ. කෙසේ වුවත් ප්‍රජා සංවර්ධනයේ පරමාර්ථය වූ කලි කිසියම් ප්‍රජාවකගේ ජීවන තත්වය උසස් කරලීම බව නම් පැහැදිලිය. ප්‍රජා සංවර්ධන ක්‍රියාවලිය ඇත අතීතයේ පටන්ම මානව ශිෂ්ඨාචාරය තුල (උදාහරණයක් වශයෙන් බෞද්ධ සංස්කෘතිය සැලකිල්ලට ගත හැකිය) ක්‍රියාත්මක වූ අතර සංකල්පීය වශයෙන් භාවිතයට පැමිණියේ තුන් වන ලෝක යුද්ධය සහ කාර්මික විප්ලවය හේතු කොට ගෙන ලෝකය දියුණු සහ නොදියුණු හෝ අඩු දියුණු කොටස් ලෙස බෙදී යෑමත් සහ ඊට අමතරව මේ දෙකොටසම තුල විද්‍යාමාන වූ සමාජ විසංවිධානයන් හේතු කොට ගෙන ඇති වූ අහිතකර තත්වයන් මඟහැර ඒ ඒ ජනකොටස් නංවාලීමත් අරමුණු කොට ගෙනය.

මෙසේ මෙම සංකල්පය භාවිතය සඳහා පැමිණුනද, පිළි ගැනීමක් ලැබුවද නිල සහ නිල නොවන අංශ එම ක්‍රියා වලියේ යෙදුනද ඒ සම්බන්ධයෙන් පැහැදිලි කෙටි නිර්වචනයක් දීම අපහසුය. අදහස්, අරමුණු, උපන්‍යාස සහ ඇඟැයුම් විශාල ගණනාවක් මෙම සංකල්පය සමග සුළුවෙන් හෝ ඇදී පවතී. ටී. ආර් බැටින් [1973] අනුව මේවා අංශ කීපයක් ඇසුරින් ගොනුකර දැක්වීමට පුළුවන.

1. භෞතික හෝ ද්‍රව්‍යාත්මක දියුණුව : එනම් සංවර්ධනය යනු වඩා හොඳ නිවාස, සෞඛ්‍ය, අධ්‍යාපන ඇතුළු ජීවන තත්වයන් සහ භෞතික සම්පත් වඩා කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීම.

2. ප්‍රජා සහභාගිත්වය : එනම් සංවර්ධනය සිදුවිය යුත්තේ තනි පුද්ගලයින් හෝ පිටස්තර ආයතන මගින් හෝ නොව ප්‍රජාව තුලින් බව.

3. ප්‍රජා සමෝධානය : එනම් විසංවිධානය සඳහා වන නැඹුරුව රඳවා තබා ගැනීම සහ ආපසු හැරවීම.

4. ප්‍රජාතාන්ත්‍රිකරණය : එනම් සමාජ සාධාරණත්වය, සමානා අධ්‍යාපන අවස්ථාවන් ලබාදීම, සියලු ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ලබාදීම සහ ඉඩ ප්‍රස්ථා අහිමි පෑගී සිටින ජනා කොටස් ඒ තත්ත්වයෙන් මුදු හැරලීම.

එහෙත් ඉහත කී අංශ සතර පරස්පර විරෝධී විය හැක. තවත් සමහර විට පවතින සමාජ හරයන් සහ සංස්කෘතික ඇගයුම්, අප ගොඩ නැගීමට උත්සාහ කරන නව සමාජය හා ගැටීමට පුළුවන. උදාහරණ වශයෙන් 1917 ලංකාවේ සෞඛ්‍ය තත්වය නංවාලීම උදෙසා වූ කොකු පණු රෝගය වැලැක්වීමේ ව්‍යාපාරයට ඉන්දියානු වතු කම්කරුවන් ගෙන් මෙන්ම සිංහල ගැමි

ජනකාවගෙන්ද දැඩි විරෝධතා නැඟුණි. එසේ වූ කල ප්‍රජා සහභාගිත්වය වෙනුවට ඇති වන්නේ ප්‍රජාව මගින් එය ප්‍රතික්ෂේප කිරීමකි. මෙය ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියක අරමුණු හා පරිබාහිර වූවකි. අධ්‍යාපනය නැංවීමේ වැඩ පිළිවෙලක් ගත් විට එහි සාර්ථකත්වය රැඳෙන්නේ පෞද්ගලිකව තම තමන් ගන්නා උත්සාහය මත විනා ප්‍රජාවක් වශයෙන් සාමූහිකව ගන්නා උත්සාහයන් මත නොවේ. ප්‍රජාතාන්ත්‍රිකරණයද දේශීය සමාජයේ සම්ප්‍රදායික පැවැත්මට අභියෝගයක් වනු ඇත. සංවර්ධනය යනුවෙන් අප අදහස් කරන දේට ඇතුලත් වන ඇගයුම් සමූහය, සංවර්ධන ක්‍රියාවලියට ලක්වන සමාජයේ තිබෙන අනිකුත් ඇගයුම් වලට පරස්පර විරෝධී නොවේ යයිද සමාජයේ සාමාජිකයන්ට අනිවාර්යයෙන්ම වඩාත් හොඳ ජීවන තත්වයක් මෙම ක්‍රියාවලිය තුලින් ඇති වේ යයිද බොහෝ අය උපකල්පනය කරති. ඒ නිසාම්ප්‍රජාව විසින් මෙම ව්‍යාපෘතීන් පිළිගත යුතු යයිද ඔවුනු බලාපොරොත්තු වෙති. එහෙත් සත්‍ය තත්වය එයම දැයි ප්‍රශ්න කිරීමට අපට පුළුවන.

මේ අනුව අපට ස්ථිර ව එළඹිය හැකි නිගමනය නම් ප්‍රජා සංවර්ධනය විවිධ අංශ ගණනාවක දියුණුව ඇති කරන, විවිධ අංශවලින් පටන් ගෙන අවසානයේ පොදු වැඩ පිළිවෙලක් තුල සමායෝජනය වන ක්‍රියාදමයක් විය යුතු බවයි. එමෙන්ම සංවර්ධන වැඩ පිළිවෙලක් දියත් කිරීමට පෙර එම ප්‍රදේශය සහ එහි ජනතාව ගැනත් ඔවුන්ගේ අවශ්‍යතා ගැනත් දැන සිටීම අවශ්‍ය වෙයි. මෙම තොරතුරු සියල්ල ලේඛනගත කළ පසු වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීම සහ ඇගැයුම් කිරීමට එය පදනමක් වශයෙන් තබා ගැනීමට පුළුවන.

III

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන ව්‍යාපාරය.

මෙම න්‍යායාත්මක පසුතලය මත මෑතදී ක්‍රියාත්මක වූ ප්‍රධාන පෙළේ ප්‍රජා සංවර්ධන වැඩ පිළිවෙලක් වූ නිවාස සංවර්ධන ව්‍යාපාරය පිළිබඳ විමසිමක් කිරීමට මෙහිදී උත්සාහ කෙරේ. නිවාස වැඩ පිළිවෙල ඇසුරින් ප්‍රජා සංවර්ධනය ඇති කිරීමේදී යම යම විශේෂ ලක්ෂණ පදනම් කරගත් ප්‍රජා වර්ගීකරණයක් කිරීම අවශ්‍ය එකකි. මානව වර්ග අනුව හෝ ජන කොටස් අනුව ප්‍රජාව වර්ගිකරණයකට භාජනය කිරීම මේ සඳහා යෝග්‍යතම ක්‍රමය යයි අපට කිව නොහැක. එහෙයින් ජීවත් වන ප්‍රදේශ අනුව වර්ගිකරණයක් කෙරේ එළඹෙන්නට අපි මෙහිදී උත්සාහ කරමු.

1. වී වගා කරන ගම්වල සිටින ජනතාව (සාමාන්‍ය ගම්)
2. වාරිමාර්ග ක්‍රම ඇති පෙදෙස්වල සිටින ජනතාව (ඇති කරන ලද ගම්)
3. තේ රබර් ආදී වතු වල වැඩ කරන ජනතාව
4. ධීවර ගම්වල සිටින ජනතාව
5. සමාජයේ පහත් යයි සම්මත කුල වල අයත් ජන කොටස් (රොඩී, පදු, කින්නර, කුඹල්)
6. නගරයේ මුඩුක්කුවල ජීවත් වන ජනතාව
7. නගරයේ කුලී නිවාස ආදියේ සිටින සුළු මධ්‍යම පංතික ජන කොටස්
8. නගරයේ තමන්ගේම නිවාස හිමි අවශේෂ මධ්‍යම පංතික සහ ඊට වඩා ඉහළ ජන කොටස්.

පුළුල් ප්‍රජා සංවර්ධන වැඩ පිළිවෙලකදී මේ සියළුම ජන කොටස්වල අවශ්‍යතා ආවරණය විය යුතුය. ජීවන වෘත්තිය අනුව වර්ගීකරණය කළොත් ලාංකික සමාජය පුළුල් වශයෙන් කෙබඳුද? කෘෂිකර්මයේ යෙදෙන පවුල් ලක්ෂ ගණනකි. වාරිමාර්ග ආශ්‍රිත ප්‍රදේශවල ජීවත් වන පවුල් ලක්ෂ ගණනාකි ධීවර පවුල් තවත් දහස් ගණනකි. වතු ජනතාව තවත් ලක්ෂ ගණනකි. මෙම සමාජ ස්ථරයන් වෙනම වෙන සැලකුවද ඒවා තුල විවිධ බෙදීම් ඇති බවද පෙනී යයි. එබැවින් මෙවැනි සමාජ ආර්ථික ව්‍යුහයක් තුල එකම වැඩ පිළිවෙලක් සියල්ලන්ටම නුසුදුසු බව හැඟේ.

නිවාස හිමි ජනතාවකගෙන් හෙබි ජාතියක් ඇති කිරීම ප්‍රධාන කොට බලාපොරොත්තු වන ලාංකීය ප්‍රජා සංවර්ධන ව්‍යාපාරයක අවශ්‍යතාවය පැහැදිලිව පෙන්නුම් කරන මූලික සමාජ ප්‍රශ්න කිහිපයක් තිබේ. එක් අතකින් දිනෙන් දින ඉහල යන ජීවන වියදම් සහ ගෙවල් කුලී විද දරා ගත නොහැකිව පහල මධ්‍යම පංතික තත්වයක සිට මුඩුක්කු තත්වයට ඇදීයමින් සිටින ජන කොටසාශයන් නගරයේ සිටී. ඒ හැරෙන්නට සාපේක්ෂක වශයෙන් පහළ ජීවන තත්වයක් උරුම කර ගෙන සිටින මුඩුක්කු සමාජයක්ද නගරයේ ජීවත් වේ. නාගරික පහසුකම් භුක්ති විඳීමේ වාසිය ලබා සිටින මෙම කොටස් නගරයෙන් ඉවත් වීමට කැමැත්තක් දක්වන්නේද නැත. නිවාස ප්‍රශ්නය වඩාත් උග්‍ර වන්නේ රැකියා සොයා ගම්බද ප්‍රදේශවල සිට නගරය කරා ඇදී එන ජන සංක්‍රමණය හේතු වෙනි. අනෙක් අතට ග්‍රාමීය සහ වතු අංශය ගත් විටද රැකියා උණතාවයෙන් පීඩනය ලබන ජන කොටස්ද සමාජයේ වෙනස්වීම්වල බලපෑමෙන් එකී ග්‍රාමීය සමාජය තුල ජීවත්වීම අපහසු වී සිටින ජන කොටස්ද සිටී. මෙකී කොටස් නගරයට සංක්‍රමණය වීම වැලැක්වීමද සමාජ අවශ්‍යතාවයක් බවට පත්ව තිබේ. එමෙන්ම මෙම කොටස් එකී සමාජයේ තව තවත් පහලට ඇද වැටීම වැළැක්වීමද සමාජ අවශ්‍යතාවයක් බවට පත්ව ඇත.

මෙකී සියළුම අංශවල ජනතාවට තමන්ගේ නිවෙස් ලබා දුන් විට ඒ අය නිවාස හිමියන් නැත්නම් දේපල හිමියන් වශයෙන් සිය සමාජ තත්වය වෙනස් කර ගන්නවා පමණක් නොව ඉහතකී සමාජ ආර්ථික දරිද්‍රතාවයන්ගෙන් බෙරීමටද නව තත්වයන් තුල විශේෂ පහසුකම් රාශියක් විඳීමේ හැකියාවද ලබති. මෙම සමාජ ආර්ථික පදනම වඩාත් පුළුල් ප්‍රජා සංවර්ධන ව්‍යාපාරයක් සඳහා අවශ්‍ය ආර්ථිකමය වුත් සමාජමය වුත් පදනමක් සපයනු ඇතැයි කිව හැකිය. සාමාන්‍යයෙන් නිවාස වැඩ පිළිවෙල මගින් සමාජයේ අවශේෂ ප්‍රදේශවල තිබිය යුතු අවශ්‍යතා එනම් ප්‍රජා ශාලා, තැපැල්, විදුලිය, යනීපාරක්ෂක කටයුතු සහ පාරවල් ආදිය ආරම්භයේදීම සැපයීමට අවශ්‍ය පියවර ගෙන ඇත. එසේ නම් එවැනි ප්‍රජාවක් තුල අපට ඇති කළ හැකි ප්‍රජා සංවර්ධනය කුමන ආකාරයේ විය යුතු ද?

IV

නිවාස සංවර්ධන ව්‍යාපාරය තුලින් කළ හැකි ප්‍රජා සාවර්ධනය.

1. විශේෂයෙන්, ඔවුන් ජීවත් වූ පැරණි සමාජයේ තිබූ ආකල්ප වෙනස් කිරීම: කාලයක් මුළුල්ලේ නොවිසඳුනු යම් යම් ප්‍රශ්න යටතේ ජීවත් වී පුරුදු වූ පසු ඒවා ඇගයුම් රටාවක් බවට පත්වී කුඩා සංස්කෘතියක් නැත්නම් උප සංස්කෘතියක් ඇති වේ. මෙහි සමහරක් අංග මූලික සමාජයේ ඇගයුම් සමඟ එකට ඇදේ නම්, නැත්නම් සමානත්වයක් දරයි නම් එම සංස්කෘතික සම්බන්ධතාවයේ ස්වරූපය අනුව තවදුරටත් මෙම උප සංස්කෘතීන් යටෝක්ත මූලික සමාජය තුල පවතිනු ඇත. උදාහරණයක් වශයෙන් උපයන ආදායමින් කොටසක් නැදෑ හිතවතුන්අතර බෙදී යාම ගත හැක. මේ නිසා නැවත වරක් චක්‍ර අයුරින් යැපුම් මට්ටමේ ජීවන තත්වයක් ඇති වේ. තවත් විශේෂයෙන් වෙනස් කළයුතු ආකල්පයක් වන්නේ මුදල් වසන් කිරීමයි.

2. ඒ අතරම ප්‍රජා සංවර්ධන උත්තේජකයන් වශයෙන් ප්‍රයෝජනයට ගත හැකි යම් යම් සමූහ හඳුනාගත හැකිය. උදහරණයක් වශයෙන්, යම් නිවාස ව්‍යාපාරයක දෙමාපියන්, දු දරුවන්, පාසැල් යන ළමයි, රැකියා වලට යන අය, වතුවල යම් යම් රැකියාවල යෙදෙන අය පොදු කටයුතු වලට නායකත්වය දෙන අය ආදි වශයෙන් යම් යම් කාණ්ඩ හඳුනා ගත හැකිය. ඒ ඒ සමූහ තුලට විශේෂ වැඩ පිළිවෙලවල් සැකසීම සහ ඒවා අවශේෂ ජනතාව අතරට ගෙනයාම මෙකී සමූහ මඟින් කළහැකි වේ.

3. නිවාස ලාභී කණ්ඩායම් තුල ඇති නිපුණතා හා හැකියා ශ්‍රීමෙන්ම විවේක වේලාවන් ගැනද අවබෝධයක් ලබාගෙන ඒවා යම් යම් ව්‍යාපෘති අතරට ගෙන ඒම මඟින්ද ප්‍රජා සංවර්ධනයක් ඇතිකළ හැකියි.

4. මේ හැරෙන්නට රජයේ හා දෙපාර්තමේන්තුවල ආධාරය ලබා තරමක් ඉහළ මට්ටමේ ව්‍යාපෘතීන් ඇති කළ හැකිය. විශේෂයෙන් සමාජය විද්‍යානුකූලව අධ්‍යයනය කරන අයට, නිවාස ලාභීන් අවට සමාජයේ යම් යම් අංග සහ ආයතන සමහ සම්බන්ධතා ඇතිකර ගත යුතු ආකාරය යෝජනා කිරීම පහසු වේ. නිවාස සැදීමේදී අත්තම් ආදී ක්‍රම භාවිතයේ යොදු ඇති අතර ඒවා රජයේ නිලධාරීන් හෝ ආයතන සමහ යම් ආකාරයක ගැටීමෙන් අත්දැකීම් ලබා ඇති පසුබිමක තවදුරටත් වර්ධනය කරගත හැකිය.

5. අවට වටා පිටාවේ ඇති සමාජය සමඟ මනා සමායෝජනයක් ඇති කිරීම විශේෂයෙන් ම අපහසු කාර්යයකි. අවට සමාජයේ විවිධ දේශපාලන සමිති සමාගම් ඇති අතර රජයට හිතවත්කම් දක්වූ එහෙත් නිවාස නොලැබුණු අය සිටින්ටද දැඩිවන. තවත් සමහර විට විශාල සමාජයෙන් පරිබාහිරවූ කුඩා සමාජයකට විශේෂ ආධාර සැලකිලි ලැබේ යයි ඊර්ෂ්‍යාවක් සමහරුන් තුළ ඇති වී එය අප ලබා ගන්නට උත්සාහ කරන අරමුණු වලට පටහැනි වන්ට පුළුවන. මෙවැනි අවස්ථාවලදී ව්‍යාපෘතීන්හි පරිමාණය වෙනස් කිරීම තුලින් අවට ජනතාව සමීප කර ගැනීමෙන්ද, ගමේ පොදු වැඩ කටයුතු (මං මාවත් හා, ළිං තැනීම, විවිධ උත්සව ආදිය) වලට ක්‍රියාත්මක සහයෝගය දීමෙන්ද වඩා සුහද වූත් මානුෂික වූත් සම්බන්ධතා ඇති කර ගැනීමට පුළුවන.

6. විවිධ ඉවිධිමත් සමාජ ආයතන සහ සංවිධානයන් සහභාගි කර ගැනීම. උදහරණයක් වශයෙන් විවිධ ආගමික ආයතන, 'ලුම්පන්' කම්කරු පංතිය, සහ පුද්ගලික අංශයේ නිපුණතා සහ කුශලතා යොදු ගැනීම දක්විය හැකිය.

7. අවට පරිසරයේ ඇති සම්පත් ප්‍රයෝජනයට ගැනීම සහ සංවර්ධනය කිරීම.

8. නිවාස යනු නිවාස ඉදි කිරීමෙන්ම නිමා වන ප්‍රශ්නයක් හෝ අරමුණක් නොවේ.

V

සම්පිණ්ඩනය.

තව තවත් විවිධ ප්‍රජා සංවර්ධන උපක්‍රම ගණනාවක් ගැන සඳහන් කළ හැකිය. එහෙත් අප විශේෂයෙන් මතක තබා ගත යුතු කරුණු කිහිපයක් සඳහන් කර මේ ලිපිය අවසාන කිරීම වඩාත් උචිත වේ යයි සිතමි. ප්‍රජා සංවර්ධන වැඩ පිළිවෙලවල් නිතරම ජනතාව තුලින්ම මුල පිරීම ඇති වී, ප්‍රකාශිත වීම වඩාත් ස්වභාවික බව බොහෝ දෙනෙක් අදහස් කරති. එමෙන්ම ප්‍රජා සංවර්ධන වැඩ පිළිවෙලවල්වල අසාර්ථකත්වය පිළිබඳ වැරදි ජනතාව මත පැටවීමත් බොහෝ දෙනෙක් අතින් නිතර සිදු වන දෙයකි. මෙවැනි අදහස් දරන අය, පුද්ගලයන්ගේ සමස්ථ එකතුව අවශ්‍යයෙන්ම සමාජය යැයි උපකල්පනය කරන බව පෙනෙන්ට ඇති අතර ජනතාවට ඉහළින් ජනතාව කෙරේ නිර්ණාත්මක බලපෑමක් කරන කිසියම් ව්‍යුහයක් තිබෙන බව අමතක කරති. ප්‍රජා සංවර්ධනය ගැන සලකන පිරිස් විශේෂයෙන්ම මෙම ව්‍යුහය හඳුනා

ගැනීමට උත්සාහ කළ යුතුය. සමීක්ෂණයන් සහ අධ්‍යයනයන් කිරීම තුලින් සමාජ ප්‍රශ්නයන් මොනවාදැයි අඳුනා ගැනීමටත් සමාජ ක්‍රියාවලීන්හි දිසාවන් අඳුනා ගැනීමටත් උත්සාහ කළ යුතුය. ප්‍රායෝගිකව බලන කල ප්‍රජා සංවර්ධන වැඩ පිළිවෙලවල්වල සාර්ථකත්වයට සහාය විය හැකි කරුණක් වශයෙන් ඒ ඒ සමාජ මට්ටම්වල සිටින බලපෑමක් කළ හැකි ''වැදගත්'' පුද්ගලයන් ප්‍රජා සංවර්ධන වැඩ පිළිවෙලවල් වලට සම්බන්ධකර ගැනීම දක්විය හැකිය. සමහර විට ප්‍රජා සංවර්ධන වැඩ පිළිවෙලවල් ඔවුනට ''විකිණීමට'' හැකි වේ. කෙසේ වුවද මෙය ඇතැම් විට භයානක ප්‍රතිඵල ගෙන දිය හැකි නිසා ඉතා පරිස්සමින් කළ යුතු දෙයකි. අතීතයේ මෙන්ම දැනට ද ප්‍රජා සංවර්ධන වැඩ පිළිවෙලවල්වල තිබෙන දුර්වලකම් අතර ප්‍රධාන තැනක් ගන්නේ විවිධ මට්ටම් වලදී ඉතිපත්තිමය සමෝධානයක් ඇති වන පරිදි ඒවා සැකසී හෝ ක්‍රියාත්මක වී හෝ නොතිබීමත්, පටු අරමුණු හා අනිම්තාර්ථ ප්‍රකාශ කොට තිබීමත්. ආර්ථික වර්ධනය සිදුවන්නේ ඊට වඩා පුළුල් සමාජ වෙනස්වීම් සිදුවන වාතාවරණයක් තුළ බව අමතක කිරීමත්, අතීතයේ ප්‍රශ්න අඩු බව දැක්වෙන අයි තක්සේරුවක් මත පිහිටා ඊනියා දේශීය උපරුවක් ලබාදීමට උත්සාහ කිරීමත්ය. නිවාස වැඩ පිළිවල මඟින් මානව ජනාවාස පිළිබඳ සංකල්පය යථාර්ථයක් බවට පෙරළීමේදී ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන ප්‍රතිපත්ති සහ වැඩ පිළිවෙලවල් සකසා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

REFERENCE

Batten, T. R. [1973] 'Social Valnes and Community Development' in Ruopp ed. *Approaches to Community Development* The Hague,